**ගිරිබාව ප්‍රාදේශීය සභාව - 2022**
**-----------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ගිරිබාව ප්‍රාදේශීය සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට ගිරිබාව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්ථාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියාකර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශිය සභාවේ, මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (i) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේ දී මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ස්ථාවර වත්කමක් ලෙස ගිණුම්ගත කළයුතු අවම වටිනාකමක් හා වත්කමේ ස්වභාවය හා ආයුකාලය අනුව එය ස්ථාවර වත්කමක් ලෙස හඳුනාගැනීමකින් තොරව ඉතා සුළු වටිනාකමක් සහිත හා නැවත විකුණා මුදල් කරගත නොහැකි කෙටි ආයුකාලයක් සහිත අයිතම ස්ථාවර වත්කම් ගිණුමට ඇතුළත් කර තිබුණි. | නිවැරදි කර ගැනීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම් තැබීම කළ යුතුය. |
| (ආ) | ජර්නල් සටහන් 57 මඟින් සුන්බුන් ගබඩාවේ ආරම්භක හා අවසන් ශේෂ අතර වෙනස වූ රු.20,849ක් ප්‍රාග්ධන යෙදවුමට දායකවීමේ ගිණුම හර කිරීම නිසා වියදම අඩුවෙන් දක්වා තිබුණි. | සුන්බුන් ගබඩාවේ ශේෂය ලෙස 2014ටත් පෙර සිට පැවත ගෙන එන අගයක් පවතී ඒ අනුව ඉදිරියේ දී නිවැරදි කරන බව. | -එම- |

### 1.6.2 නොසැසඳුණු පාලන ගිණුම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයිතම 04කට අදාළව මූල්‍ය ප්‍රකාශනවල හා මූල්‍ය ප්‍රකාශන උපලේඛනවල රු.3,945,433 ක වටිනාකම් අතර නොසැසඳීම් පැවතුණි. | ඉදිරියේ දී ජ'නල් සටහන් මඟින් නිවැරදි කිරීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම් තැබීම කළ යුතුය. |

**1.7 අනුකූල නොවීම්**

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | **නිති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව** | **අනුකූල නොවීම** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|---|
| (අ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති | | | |
| (i) | රීති 59 | සමාලෝචිත වර්ෂය සඳහා වෙළඳ බලපත්‍ර, ව්‍යාපාර බදු හා කර්මාන්ත බදු පිළිබඳව සමීක්ෂණයක් කර නොතිබුණි. | අඩුපාඩු නිවැරදි කර ගැනීමට කටයුතු කරන බව. | අදාළ රීති උපදෙස් අනුව ක්‍රියා කළ යුතුය. |
| (ii) | රීති 218 | පත්කළ මණ්ඩලයක් විසින් වාර්ෂිකව ඉඩම් ගොඩනැගිලි ඇතුළු ස්ථාවර වත්කම් සමීක්ෂණයක් සිදු කළ යුතු වුවත් එසේ සිදු කර නොතිබුණි. | පළාත් පාලන කොමසාරිස්ගේ උපදෙස් ලැබෙන තෙක් ක්‍රියාවලිය ප්‍රමාද වී ඇති බව. | -එම- |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵලය**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.1,792,758 ක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන ආදායම ඉක්ම වූ වියදම රු.1,966,795ක් විය.

**2.2 ආදායම් පරිපාලනය**

**2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම් රැස්කළ ආදායම් හා හිඟ ආදායම්**

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2022 | | | | 2021 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය(බිල් කළ ආදායමින්) | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය (බිල් කළ ආදායමින්) |
| | රු. ,000 | රු. ,000 | රු. ,000 | රු. ,000 | රු. ,000 | රු. ,000 | රු. ,000 | රු. ,000 |
| (i)වරිපනම් හා බදු | 15 | 76 | 76 | 0 | 15 | - | 15 | 0 |
| (ii)කුලී | 1887 | 1989 | 1865 | 124 | 2206 | 1399 | 967 | 432 |
| (iii)බලපත්‍ර ගාස්තු | 112 | 972 | 972 | 0 | 100 | 867 | 867 | 0 |
| (iv)වෙනත් ආදායම් | 9369 | 14196 | 10513 | 3683 | 3500 | 3500 | 1486 | 2013 |
| එකතුව | 11,383 | 17,233 | 13,426 | 3,807 | 5,821 | 5,766 | 3,335 | 2.445 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | **කුලී** | | |
| | සභාවේ වාර්ෂික ටෙන්ඩර් මත බදුදීම්වලට අදාළව අයවිය යුතු රු.96,260ක බදු මුදලක් වසර 5කට වඩා පැරණි හිඟ ශේෂයක් අය වීමට තිබුණි. | රු.4000 බැගින් වාරික වශයෙන් ගෙවීමට බදු කරු එකඟ වී ඇති බව. | හිඟ බදු කුලී කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | **උසාවි දඩ හා මුද්දර ගාස්තු** | | |
| | පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් 2022 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.5,674,000 ක් මුද්දර ගාස්තු රු.1,153,627ක් විය. | ඉදිරියේ දී අයකර ගැනීමට කටයුතු කරන බව. | කඩිනමින් ගෙන්වා ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසම්බර් 31 දිනට ගෙවිය යුතු ගිණුම් ශේෂ 05ක වටිනාකම රු.60,871,846 ක් වූ අතර ඉන් වසර 1 සිට 5 දක්වා කාලයට අදාළව ගිණුම් ශේෂ එකතුව රු.60,871,846 ක් විය. | කර්මාන්ත ණයහිමි ශේෂයන් හා ටෙන්ඩර් තැන්පත් ආපසු ගෙවිය හැක්කේ දේපලේ බදු කාලය නිම වූ පසුව නිසා ගිවිසුම් ඇප බදු කාලය නිම වනතෙක් ආපසු ගෙවිය නොහැකි බව. | ගෙවිය යුතු ශේෂ නිරවුල් කර ගැනීමට කටයුතු කළ යුතුය. |

### 3.2 වත්කම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | **පවරා නොගත් වත්කම්** | | |
| | සභාව විසින් පරිහරණය කරන ජීප්රථය හා කැබ් රථයේ අයිතිය සහ සභාව සතු ඉඩම් ගොඩනැගිලි හා සුසාන භූමි වත්කම් 34ක් සමාලෝචිත වර්ෂය දෙසැම්බර් 31 වන විටත් සභාව වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | ජීප් රථය පවරා දෙන ලෙස දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෙත ද කැබ් රථය පවරා ගැනීම සඳහා පළාත් සභා අමාත්‍යාංශය වෙත යොමු කර ඇති බව. | පවරා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | **වත්කම්වල ආරක්ෂාව තහවුරු නොකිරීම** | | |
| | සභාව සතු සුසාන භූමි බොහොමයක් ආරක්ෂක වැට මායිම් යොදා නිසි පරිදි යොදා ආරක්ෂාව තහවුරු කර නොතිබුණි. | සුසාන භූමි සඳහා වැට මායිම් සකස් කිරීමට කටයුතු කරන බව. | වත්කම්වල ආරක්ෂාව තහවුරු කර ගැනීමට කටයුතු කළ යුතුය. |

(ඇ) **වත්කම් ලේඛනගත නොකිරීම**

| | | |
|---|---|---|
| සභාව විසින් ලී බඩු හා උපකරණ හා යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ යන ස්ථාවර වත්කම් සඳහා වත්කම් ලේඛන පවත්වා ගෙන ගොස් නොතිබූ අතර වාහන ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර නොතිබුණි. | අඩුපාඩු නිවැරදි කර ගැනීමට කටයුතු කරන බව. | සියලු වත්කම් ලේඛනගත කර යාවත්කාලීනව පවත්වාගත යුතුය. |

## 3.3 නිෂ්ක්‍රීය/ඌන උපයෝජිත වත්කම්

| **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| සභාව සතු ජල බවුසරය වසර 05ක පමණ කාලයක සිට භාවිතයකින් තොරව දිරාපත් වෙමින් පැවතුණු අතර සභාව සතු නළ ළිං 146න් නළ ළිං 69ක් ම අක්‍රීය තත්ත්වයේ පැවතිණි. තවද සභාවට අයත් කසළ රැස් කිරීම සඳහා වෙන්කර ඇති කසළ ටේලරය 2022 වර්ෂය තුළ කිසිදු උපයෝජනයක් කර නොතිබුණි. | කසළ ට්‍රේලරය අවශ්‍යා අවස්ථාවල භාවිත කරන බව. | ප්‍රයෝජනයටගත හැකි වත්කම් අලුත්වැඩියා කිරීමට හා නිෂ්ක්‍රිය වත්කම් අපහරණය කිරීමට කටයුතු කළ යුතුය. |

## 3.4 මානව සම්පත් කළමනාකරණය

| **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| (අ) **සේවක පුරප්පාඩු හා අතිරික්තය** | | |
| තෘතියික අංශයේ පුරප්පාඩු 01ක් ද, ද්විතීක අංශයේ පුරප්පාඩු 06ක් ද, ප්‍රාථමික අංශයේ පුරප්පාඩු 09ක් ද සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පැවතුණි. | විගණන නිරීක්ෂණ නිවැරදි බව. | තනතුරු පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතුය. |
| (ආ) **සේවක ණය** | | |
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සේවයෙන් ඉවත්කල නිලධාරියෙකුගෙන් අයවිය යුතු රු.17,100ක් හා මියගිය නිලධාරියෙකුගෙන් අයවිය යුතු රු.14,099ක් ලෙස එකතුව රු.31,199 ක අය නොවන සේවක ණය ශේෂයක් පැවතුණි. | සේවක ණය හිඟය අය කර ගැනීමට කටයුතු කරන බව. | හිඟ ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

**4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

**අයවැය පාලනය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ආදායම් විෂයයන් 02ක ඇස්තමේන්තුගත හා සත්‍ය ආදායම් අතර සියයට 57 සිට 89 දක්වා විචලනයක් පැවති අතර වියදම් විෂයයන් 04ක ඇස්තමේන්තුගත ප්‍රතිපාදන හා සත්‍ය වියදම අතර සියයට 32 සිට 92 දක්වා විචලනයක් පැවතීම හේතුවෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කර ගෙන නොතිබුණි. | ඉදිරියේ දී ඒ අනුව කටයුතු කරන බව. | මනා අයවැය පාලනයක් පවත්වාගත යුතුය. |